699

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 07 | |
| විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I | |
| කාලය / காலம் / Time | පැය 02 | |

නම :- ................................................................................................ විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි:
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) දිවැසිවරයා යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන තැනැත්තා ය.
(2) දෙවියන් වහන්සේට ආදරය කරන තැනැත්තා ය.
(3) දෙවියන් වහන්සේව හඳුනන තැනැත්තා ය.
(4) දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන තැනැත්තා ය.

(02) පුරාණ ගිවිසුමේ ප්‍රධාන දිවැසිවරුන් වනුයේ,
(1) හොසියා, ජොවෙල් සහ ආමොස් ය.
(2) යෙසායා, ජෙරමියා සහ එසකියෙල් ය.
(3) ජෙරමියා, සෙකරියා සහ මලාකි ය.
(4) යෙසායා, හොසියා සහ මීකා ය.

(03) 'මෙන්න මම මෙහි ය. මා යැව්ව මැනව' යනුවෙන් දෙවියන් වහන්සේගේ හඬට පිළිතුරු දුන් දිවැසිවරයා
(1) යෙසායා ය.
(2) එසකියෙල් ය.
(3) ජෙරමියා ය.
(4) එලියා ය.

(04) නිනිවයේ වැසියන් මනස්තාපනය තුළින් දෙවිඳුන් වෙතට යොමු කළේ ................................ දිවැසිවරයා ය.
(1) එලිෂා (2) නාතාන් (3) ජෝනා (4) ආමොස්

(05) ප්‍රසාද ස්නාපනයේ දී අත්‍යවශ්‍ය හා අනිවාර්ය පිළිවෙත වන්නේ,
(1) ළදරුවාගේ නළලේ කුරුසිය ලකුණු කිරීම ය.
(2) සාන්තුවර පිහිට අයැදීම ය.
(3) ළදරුවාගේ හිස මත අත් තබා යැදීම ය.
(4) හිසමත ජලය වක්කරමින් ප්‍රසාද ස්නාපනය කිරීම ය.

(06) දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමඟ ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,
(1) දිලිසෙන ගිනිහුළ
(2) දුම් නගින උඳුන
(3) දේදුන්න
(4) චර්මඡේදනය

144

(07) 'මා අනුව එන්න' යනුවෙන් ප්‍රථම ශ්‍රාවකයන් කැඳවූ ජේසුස් වහන්සේ විවිධ සේවාවන් සඳහා අප කැඳවා ඇත්තේ,

(1) ප්‍රසාද ස්නාපනය මගිනි.
(2) දිව්‍ය සත්ප්‍රසාදය මගිනි.
(3) පූජකවරය මගිනි.
(4) අභිවෘද්ධි ආලේපය මගිනි.

(08) ජුදාස්ගේ මරණයෙන් පසුව ඔහු වෙනුවට තෝරා පත් කර ගත් අපෝස්තුළුවරයා වන්නේ,

(1) ශු. ජුවාම් මුනිතුමා ය.
(2) ශු. තෝමස් මුනිතුමා ය.
(3) ශු. මතියස් මුනිතුමා ය.
(4) ශු ස්තේපන් මුනිතුමා ය.

(09) A ප්‍රසාද ස්නාපනය
B පූජකවරය
C සමගි සන්ධානය
D අභිවෘද්ධි ආලේපය

ක්‍රිස්තුන් වහන්සේ විසින් තම අපෝස්තුළුවරුන්ට පවරන ලද ධර්මදූත සේවාව ඉදිරියට ගෙන යනු ලබන්නේ.................................. මගිනි. මෙහි හිස්තැනට අදාල පිළිතුර දක්වෙන ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,

(1) A ය.
(2) B ය.
(3) C ය.
(4) D ය.

(10) පූජක උදව් සමිතියට බැඳී සේවය කිරීම පොදු පූජකවරය මගින් ඔබට ලැබෙන ........................................ කාර්යයකි.

(1) දිවැසිවර
(2) එඬේරික
(3) ධර්මදූත
(4) පූජක

(11) සත්‍ය ප්‍රකාශ කිරීමටත්, සත්‍යවාදී ලෙස ජීවත් වීමටත් අපට උගන්වන්නේ,

(1) හත්වන දේව පනතිනි.
(2) අටවන දේව පනතිනි.
(3) පස්වන දේව පනතිනි.
(4) තුන්වන දේව පනතිනි.

(12) පැවිදි ජීවිතය ගතකරන අයගේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) වේදහාර පිළිපැදීමයි.
(2) මිසම් සේවයේ යෙදීමයි.
(3) දේව රාජ්‍යය ගොඩනැගීමයි.
(4) තම නිකායේ ශ්‍රේෂ්ඨයන් අනුගමනය කිරීමයි.

(13) මීකා දිවැසිවරයා පෙන්වා දෙන පරිදි දෙවියන් වහන්සේ ගෙන්ද, සහෝදරයා ගෙන්ද අප සෑම ඇත් කරවන සිතුවිල්ල වනුයේ,

(1) තණ්හාව ය.
(2) උඩඟුකම ය.
(3) ඊර්ෂ්‍යාව ය.
(4) අලසකම ය.

(14) 'මම යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔහුට සතර ගුණයක් ආපසු දෙමි' මෙම ප්‍රකාශය කළේ,

(1) නිකදේමුස් ය.
(2) අනනියස් ය.
(3) සකේවුස් ය.
(4) සකරියස් ය.

(15) ජපමාලය උච්චාරණය කිරීමේ දී මෙනෙහි කරන 'ආලෝකයේ අභිරහස්' හඳුන්වා දෙනු ලැබුවේ,

(1) පස්වන පියුස් සුදතුම් පියාණන් විසිනි.
(2) දහතුන්වන ග්‍රෙගරි සුදතුම් පියාණන් විසිනි.
(3) එකොළොස් වන ක්ලෙමන්ට් සුදතුම් පියාණන් විසිනි.
(4) ශු. දෙවන ජුවාම් පාවුළු මුනිතුමන් විසිනි.

(16)
A ඒකත්වය
B ශුද්ධත්වය
C අඛණ්ඩභාවය
D සාධාරණත්වය

කිතුනු විවාහයේ ලක්ෂණ ලෙස සැලකෙන්නේ ඉහත කරුණු අතරින්,

(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ D ය. (4) B සහ C ය.

(17) 'මා සමඟ එක පැයක්වත් අවදිව ඉන්න ඔබට බැරිවුණාද' යනුවෙන් ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගෙන් කළ ඉල්ලීම අප ඉටු කරනුයේ,

(1) මර්දන ක්‍රියා මගිනි. (2) භාවනාව මගිනි.
(3) ශුද්ධ වූ පැය මගිනි. (4) එක්වරු ශීලය මගිනි.

(18) මරියතුමියගේ උදාන ගීය මෙනෙහි කරන අනිවාර්ය අවස්ථාවක් වනුයේ,

(1) සන්ධ්‍යා මෙහෙයයි. (2) සදාසරණ නුවානයයි.
(3) දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයයි. (4) මංගල්‍යය දිව්‍ය පූජාවයි.

(19) පාද නමස්කාරය තුළින් අප සිහිපත් කරන්නේ ජේසුස් වහන්සේගේ

(1) කුරුසියේ උකුත්වීම ය. (2) දුක්ප්‍රාප්තියේ ගමන ය.
(3) මරණයට තීන්දු කිරීම ය. (4) ගල්ලෙනෙහි තැන්පත් කිරීම ය.

(20) දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වනුයේ,

(1) අපට අවශ්‍ය ශාරීරික හා මානසික සුවය ලබා ගැනීම ය.
(2) ජේසුස් වහන්සේගේ ඉල්ලීමක් ඉටු කිරීමට ය.
(3) මීසම් සංසයක් ලෙස අපගේ එකමුතුකම පෙන්වීමට ය.
(4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට අපගේ වන්දනාව පුද කිරීමට හා උන්වහන්සේගේ ආශිර්වාදය ලබා ගැනීමට ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යයි.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.

(01) 'දේව පනත් අනුසාර කරමින් යහපත් ජීවිතයක් ගත කරමු' යන මැයෙන් ඔබ විසින් කරන ලද ඇගයීම ඇසුරින් මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) හතරවන දේව පනත ලියන්න. (ලකුණු 02)
(2) දෙමව්පියන් වෙනුවෙන් දරුවන්ට පැවරෙන යුතුකම් හතරක් ලියන්න. (ලකුණු 04)
(3) හත්වන සහ දහවන දේව පනත් දෙක ලියන්න. (ලකුණු 04)
(4) දසවන පනත අනුව ජීවත්වීමේ දී ඔබ විසින් පිළිපැදිය යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)
(5) සත්‍යගරුක සමාජයක් ගොඩනැගීමට පාසල් සමාජය තුළ ඔබට දායක විය හැකි ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

(02) (1) 'දිව්‍ය සංරක්ෂණය' යනු කුමක් ද? (ලකුණු 02)

(2) දේශක දිවැසිවරුන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(3) දේවස්ථානයේ පූජනීය බව හා ගරුත්වය ආරක්ෂා කිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් 3ක් ලියන්න. (ලකුණු 06)

(03) (1) ආබ්‍රහම්තුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග 2ක් ලියන්න. (ලකුණු 02)

(2) ඔබ තුළ තිබිය යුතු නායකත්ව ගුණාංග 3ක් ලියන්න. (ලකුණු 03)

(3) ප්‍රසාද ස්නාපන පොරොන්දු අනුව ඔබ ක්‍රියා කළ යුතු ආකාරය කරුණු 3කින් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (1) කතෝලික පූජා ප්‍රසාදිවරුන් බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් ඉටු කිරීමට සහයවන මීසමේ ඇති සමිති 3ක නම් ලියන්න. (ලකුණු 03)

(3) පූජා ප්‍රසාදිවරුන් වෙනුවෙන් අප ඉටුකළ යුතු යුතුකම් 3ක් ලියන්න. (ලකුණු 06)

(05) (1) ප්‍රථම ශ්‍රාවකයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(2) ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කළ ශ්‍රාවකයින් ක්‍රියා කළ අයුරු කරුණු 3කින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(3) ක්‍රිස්තුන් වහන්සේ ලොවට හඳුන්වා දීමට ඔබට කළ හැකි දේවල් 3ක් ලියන්න. (ලකුණු 06)

(06) (1) 7 වන දේව පනතින් අපට තහනම් කර ඇති ක්‍රියාවන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) සාධාරණව වස්තුව ලබාගත හැකි මාර්ග 3ක් ලියන්න. (ලකුණු 03)

(3) පහත සඳහන් අවස්ථාවල දී ඔබ ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

i. ටිකට් පතක් නොගෙන බස් රථයේ ගමන් කිරීමට ඉඩ ලැබුණ විට

ii. පාසල් භූමියේ තිබී වටිනා දෙයක් ඔබට ලැබුණ විට

iii. බඩු මිල දී ගත් ඔබට කඩහිමියා අතින් වැඩිපුර මුදලක් ලැබුණ විට

(07) (1) පාද නමස්කාරයේ පළමුවන ස්ථානයේ දී අප සිහිපත් කරන සිදුවීම කුමක් ද? (ලකුණු 02)

(2) අප විසින් ජපමාලය උච්චාරණය කරනු ලබන අවස්ථා 3ක් ලියන්න. (ලකුණු 03)

(3) දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය අර්ථවත්ව, සැමරීමට ඔබ කළ යුතු කාර්යයන් 3ක් ලියා දක්වන්න. (ලකුණු 06)